11. 07. 2016

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**ඉතිහාසය** **6 ශ්‍රේණිය**

විභාග අංකය :.............................................. කාලය පැය 02 යි

සැලකිය යුතුයි:

★ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

★ අංක 1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදැරීමට ඉවහල් වන ක්‍රිස්තුවර්ෂ හතරවන සියවස රචනා වූ සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
(1) මහා වංසය. (2) දීප වංසය. (3) චූල වංසය. (4) බෝධි වංසය.

02. ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන පුරා විද්‍යාත්මක මූලාශ්‍රය යටතට අයත්වන දේ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පැරණි පොත්පත් හා ජනකථා. (2) පැරණි පොත්පත් හා මිනිස් ඇටසැකිලි.
(3) පැරණි බඩුභාණ්ඩ හා මිනිස් ඇටසැකිලි. (4) පැරණි බඩුභාණ්ඩ හා ජනප්‍රවාද.

03. ඉතිහාසයේ විවිධ සිදුවීම් සම්බන්ධයෙන් කාලය මැන ගැනීමට වැඩි වශයෙන් භාවිත වන ක්‍රිස්තු වර්ෂ ක්‍රමය පදනම් වනුයේ,
(1) ක්‍රිස්තුන් වහන්සේ ගේ උප්පත්තිය ලැබූ වර්ෂය පදනම් කරගෙන ය.
(2) ක්‍රිස්තුන් වහන්සේ ගේ මරණය සිදුවූ වර්ෂය පදනම් කරගෙන ය.
(3) බුදුන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවූ වර්ෂය පදනම් කරගෙන ය.
(4) මහම්මත් තුමාගේ උපන් දිනය සිදුවූ වර්ෂය පදනම් කරගෙන ය.

04. මීට අවුරුදු දශලක්ෂ පන්සිය හතළිස් දෙකකට පෙර ජීවත් වූ ඔපබීනියාවකුගේ පාෂාණීභූත සලකුණක් මුල්වරට හමුවූ රට වනුයේ,
(1) ඇමරිකාව ය. (2) අයිස්ලන්තය ය. (3) කැනඩාව ය. (4) ඉන්දියාව ය.

05. වානර පවුලකින් මානව පරම්පරාවක් බිහිවීමට බලපෑ ප්‍රධානත ම හේතුව වූයේ,
(1) මහා හිමයුගයේ පැවති දේශගුණ විපර්යාසය ය.
(2) චිම්පන්සින් ආහාර නොගෙන සිටීමට ය.
(3) මහා හිම යුගයේ ආහාර සුලභ වීම ය.
(4) චිම්පන්සින් ගේ දත්වල හා මුහුණේ වෙනස්කම් සිදු වීම ය.

06. මීට අවුරුදු දශලක්ෂ 2.3 ත් 1.4 ත් අතර කාල වකවානුවක ජීවත් වූ 'හැකි මිනිසා' ලෙස හැඳින්වෙන්නේ,
(1) ඔස්ට්‍රෙලෝපිතිකස් මානවයා ය. (2) හෝමෝහැබිලස් මානවයා ය.
(3) හෝමෝ ඉරෙක්ටස් මානවයා ය. (4) හෝ මෝ නැයැන්ඩතාල්න්සිස් මානවයා ය.

07. පහත රූප සටහනේ දැක්වෙන්නේ ආදිමානවයා විසින් තම එදිනෙදා කටයුතු පහසුවෙන් හා කාර්යක්ෂමව ඉටුකිරීමට යොදා ගත් දෙයකි. එය කුමක් ද ?



(1) මිනිස් දතකි.
(2) මැටි ගුලියකි.
(3) පැරණි සත්ව ඇට කැබැල්ලකි.
(4) පැරණි ගල් මෙවලමකි.

08. කෙනෙකු මිය ගිය විට අවමංගල චාරිත්‍ර පැවැත්වීමට මිනිසා හුරු පුරුදු වූයේ,

(1) පුරා ශිලා යුගයේ දී ය. (2) නව ශිලා යුගයේ දී ය.
(3) මධ්‍ය ශිලා යුගයේ දී ය. (4) මහා හිම යුගයේ දී ය.

09. නව ශිලා යුගයේ ප්‍රධාන ලක්ෂණය සහිත පිළිතුර තෝරන්න.

(1) ධාන්‍ය වගා කිරීම, දඩයම. (2) ධාන්‍ය වගා කිරීම, තාවකාලික පැල්පත් සෑදීම.
(3) ධාන්‍ය වගා කිරීම, සත්ත්ව පාලනය. (4) දඩයම, තැන තැන ඇවිද ආහාර එකතු කිරීම.

10. පුරාණ කාලයට අයත් මැටියෙන් සෑදූ දෑකැත්තක් හමුවී ඇත්තේ කුමන ස්ථානයකින් ද ?

(1) චීනයේ ගල් ගුහාවකි නි. (2) ඉන්දියාවේ ගල් ගුහාවකි නි.
(3) කැනඩාවේ ගල් ගුහාවකි නි. (4) ඊශ්‍රායලයේ ගල් ගුහාවකි නි.

11. අපි අද ආහාරයට ගන්නා වී මුල් වරට වගා කරන ලද රට කුමක් ද ?

(1) මධ්‍යම මෙක්සිකෝව. (2) චීනය.
(3) මධ්‍යධරණී ප්‍රදේශය. (4) ඉන්දියාව.

12. ලෝකයේ විවිධ ප්‍රදේශවල හෝමෝසාපියන්වරු ජීවත් වේ. පහත A හා B රූප දෙකෙන් දැක්වෙන මානව වර්ග දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.



A රූපය



B රූපය

(1) මොන්ගොලොයිඩ්, ඔස්ට්‍රලොයිඩ්. (2) කොකසොයිඩ්, ඔස්ට්‍රලොයිඩ්.
(3) මොන්ගොලොයිඩ්, නිග්‍රොයිඩ්. (3) කොකසොයිඩ්, නිග්‍රොයිඩ්.

13. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පැවති ප්‍රදේශය වර්තමානයේ හඳුන්වනු ලබන රට වනුයේ,
(1) ඉරානය යි. (2) ඉරාකය යි. (3) ඊජිප්තුව යි. (4) චීනය යි.

14. ගිල්ග - මේෂ් රජුගැන කූන්‍ය අක්ෂරයෙන් ලියන ලද වීර කථාව ලෝකයේ පැරණි ම සාහිත්‍ය කෘතිය ලෙස සැලකේ. එම කෘතිය හමු වූ ශිෂ්ටාචාරය කුමක් ද ?
(1) නයිල් නිම්න ශිෂ්ටාචාරය. (2) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය.
(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය. (4) චීන ශිෂ්ටාචාරය.

15. මළ සිරුරු කල්තබා ගැනීමේ මමිකරණ ක්‍රමය ලොවට දායාද කරන ලද්දේ,
(1) සින්දු නිම්න වැසියන් විසිනි. (2) මෙසපොතේමියානු වැසියන් විසිනි.
(3) චීන වැසියන් විසිනි. (4) ඊජිප්තු වැසියන් විසිනි.

16. ඊජිප්තු ශිෂ්ටාචාරය බිහිවූයේ කුමන ගංගා නිම්නය ආශ්‍රිතව ද ?
(1) නයිල් ගංගා නිම්නය ආශ්‍රිතව ය. (2) යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්නය ආශ්‍රිතව ය.
(3) හොවැංහෝ ගංගා නිම්නය ආශ්‍රිතව ය. (4) සින්දු ගංගා නිම්නය ආශ්‍රිතව ය.

17. මහා වංසයේ සඳහන් අන්දමට ක්‍රි. පූ. 544 දී ලංකාවට පැමිණි විජය කුමරු ඇතුළු හත්සියක් පිරිස ගොඩබසින ලද ස්ථානය කුමක් ද ?
(1) මහා තිත්ථ. (2) ගෝකණ්න. (3) තම්බපණ්ණි. (4) දඹකොළපටුන.

18. මෙරට විසූ යක්ෂ ගෝත්‍රිකයන්ට අයත්ව තිබූ නගරයක් ලෙස හැඳින්වෙන්නේ,
(1) ලංකාපුරය ය. (2) අනුරාධපුරය ය.
(3) පොලොන්නරුව ය. (4) ඇතුගල්පුරය ය.

19. ඉන්දියන් සාගරයේ දූපතක් වූ අපේ රටට මුලින් ම මිනිසුන් පැමිණ ඇත්තේ,
(1) මීට වසර 30,000 කට පෙර ය. (2) මීට වසර 6,000 කට පෙර ය.
(3) මීට වසර 12,000 කට පෙර ය. (4) මීට වසර 125,000 කට පෙර ය.


20. ගලින් සෑදූ මෙවලම් භාවිතය, සතුන් දඩයමින් හා ඉබේ වැවුනු ආහාර අනුභවකරමින් ජීවත් වූ යුගය හැඳින්වෙන්නේ,
(1) මධ්‍යකාලීන යුගය නමිනි. (2) ගල්යුගය නමිනි.
(3) ගොවි යුගය නමිනි. (4) යකඩ යුගය නමිනි.

(2 x 20 = 40)

## II කොටස

★ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
★ අනිකුත් ප්‍රශ්න අතරින් කැමති ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
★ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5 කි.

01. A හා B වශයෙන් දක්වා ඇති රූප සටහන් පිළිබඳව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(1) මෙම රූප සටහන හඳුනාගෙන නම් කරන්න.
(2) මේ කුමන කටයුත්තක් සඳහා භාවිත කරන්නට ඇත් ද ?
(3) රූපයේ දැක්වෙන දෙය භාවිත වූ යුගය කුමන නමකින් හැඳින්වේ ද?
(4) මෙවැනි ස්ථානයකට තවත් උදාහරණයක් ලියන්න.



A රූප සටහන


(ල. 8)

(1) මෙම B රූපයෙන් දක්වෙන්නේ කවරකුගේ මූර්තියක් ද ?

(2) මෙම මූර්තිය හමුවූයේ කුමන ශිෂ්ටාචාරයක ද ?

(3) එම ශිෂ්ටාචාරය කුමන ගංගාවක් ආශ්‍රිතව බිහිවූයේ ද ?

(4) මෙම මූර්තියේ ඇස් අඩවන් කොට තෙලා තිබීමෙන් කුමක් පිළිඹිබු වේ ද ? (ල. 8)



B රූප සටහන

02. (1) ඔබේ පාසලේ ඉතිහාසය සොයා ගැනීමට උපකාර වන මූලාශ්‍ර 2 ක් ලියා දක්වන්න. (ල. 2)

(2) සාහිත්‍ය මූලාශ්‍රය ට අයත්වන උදාහරණ හතරක් ලියන්න. (ල. 4)

(3) ඉතිහාසය ඉගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පිළිබඳව වාක්‍යය පහක් ලියා දක්වන්න. (ල. 5)

03. (1) මෙවලම් වල ස්වරූපය අනුව මිනිසාගේ සංස්කෘතික දියුණුව බෙදනු ලබන යුග තුන අතරින් දෙකක් නම් කරන්න. (ල. 2)

(2) නව ශිලා යුගයේ ප්‍රධාන ලක්ෂණ 2 ක් ලියා දක්වන්න. (ල. 4)

(3) (A) පහත සඳහන් ධාන්‍ය වර්ග මුල්වරට වගාකරන ලද රට නම් කරන්න.

⋆ බඩ ඉරිඟු ⋆ තිරිඟු (ල. 2)

(B) පුරාණ ගොවි ගම්මානයක ස්වභාවය චිත්‍රයට නගන්න. (ල. 3)

04. (1) පහත සඳහන් ශිෂ්ටාචාර බිහිවීමට උපකාරී වූ ගංගා දෙකක් නම් කරන්න.

(A) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය.

(B) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය. (ල. 2)

(2) ඉන්දු නිම්න ශිෂ්ටාචාරවාසීන් නගර නිර්මාණකරුවෝ ය. එසේ නිර්මාණය කරන ලද නගර හතරක් ලියන්න. (ල. 4)

(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුණු දායාද සම්බන්ධ වැකි පහක් ලියන්න. (ල. 5)


05. (1) ගල් යුගයේ ජීවත් වූ මිනිස්සු ආහාර වශයෙන් ගන්නා ලද දේවල් දෙකක් ලියා දක්වන්න. (ල. 2)

(2) (A) විජය කුමරු ලංකාවට පැමිණි විට මෙරට විසූ ජන කණ්ඩායම හැඳින් වූ නම කුමක් ද ?


(B) විජය කුමරු සරණපාවාගත් මෙරට විසූ කාන්තාවගේ නම ? A, B අනුපිළිවෙළින් ලියන්න. (ල. 4)

(3) විජය පැමිණීමට පෙර මෙරට මුල් ජනාවාසවල නිවාසවල ස්වභාවය හා භාවිත කළ මෙවලම් පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 5)

06. (1) පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර ආශ්‍රිතව බිහිවූ පහත නිර්මාණ AB අනුපිළිවෙළින් නම් කරන්න.



A රූප සටහන



B රූප සටහන

(2) පහත සඳහන් නිර්මාණයන් ලොවට දායාද කළ ශිෂ්ටාචාරය ලියා දක්වන්න. (ල. 2)

A - සෙල්ලම් මැටි කරත්තය. B - චිත්‍රාක්ෂර කලාව. (ල. 4)

(3) මෙසපොතේමියානු ශිෂ්ටාචාරවාසීන් දෙවිවරුන් වශයෙන් පුදපූජා පැවැත්වූ දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ ආගමික කටයුතු කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

07. (1) විජය කුමරු ලංකාවට පැමිණියේ කුමන රටක සිට ද? (ල. 2)

(2) විජය කුමරු සමග පැමිණි ඇමතිවරු පිහිටුවා ගන්නා ලද ගම් දෙකක් නම් කරන්න. (ල. 4)

(3) ශ්‍රී ලංකාවේ මුල් ජනපදිකයින් අවමංගල චාරිත්‍ර පැවැත් වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)